# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 7 ශ්‍රේණිය | ඛණිජ හා පාෂාණ | ඒකකය - 18 |
|---|---|---|

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

1). මිනිරන් යනු ශ්‍රී ලංකාවේ බහුලව දැකිය හැකි,
1. පාෂාණයකි 2. ඛනිජයකි 3. ආග්නේය පාෂාණයකි 4. විපරීත පාෂාණයකි

2). එදිනෙදා ව්‍යවහාරයේදී කළුගල් ලෙස අප හඳුන්වන්නේ
1. ඩොලමයිට් සහ පෙල්ස්පාර් 2. ඉල්මනයිට් සහ පෙල්ස්පාර්
3. ග්‍රැනයිට් සහ නයිස් 4. ඩොලමයිට් සහ නයිස් වේ

3). පෘතුවියේ මතුපිට ඇති ස්ථරය වනුයේ
1. හරය 2. ප්‍රාවරණය 3. කබොල 4. ඛනිජ

4). හුණුගල් විපරීත වීමෙන් සෑදෙන්නේ
1. ග්‍රැනයිට් 2. නයිස් 3. කිරිගරුඬ 4. මිනිරන්

5). ඇපටයිට් බහුලව ඇති ප්‍රදේශය වනුයේ
1. පුල්මුඩේ 2. බෝගල 3. මාදම්පේ 4. එප්පාවල

6). පාෂාණ ජීර්ණයට හේතු වන්නේ
1. භෞතික සාධක 2. රසායනික සාධක 3. ජෛවීය සාධක 4.ඉහත සඳහන් සියල්ලම

7). "තිරුවාණා" හැඳින්වෙන තවත් නමක් වනුයේ
1. පෙල්ස්පාර් 2. ක්වාට්ස් 3. මයිකා 4. ඇපටයිට්

8). ගිනි කඳු පිපිරීමෙන් පිටවන ද්‍රව්‍යය හඳුන්වන්නේ
1. පෙල්ස්පාර් 2. ඉල්මනයිට් 3. මැග්මා 4. ක්වාට්ස් යන නමිනි

9). පොළොව අභ්‍යන්තරයට හෑරීමේදී තවදුරටත් හෑරිය නොහැකි පාෂාණයක් හමුවේ. එය හඳුන්වන නම
1.රසායනික පාෂාණයයි 2. මව් පාෂාණයයි
3. ඝන පාෂාණයයි 4. ආග්නේය පාෂාණයයි

10). ටයිටේනියම් ලබා ගැනීමට යොදා ගත හැකි ඛනිජයක් නම්
1. මයිකා 2. ක්වාට්ස් 3. ඉල්මනයිට් 4. පෙල්ස්පාර්

(ලකුණු 1×10)

## B කොටස - රචනා

01). I . a) පාෂාණ හා ඛනිජ අතර පවතින වෙනස්කම් 02 ක් ලියන්න. (ල.02)

b) පාෂාණ හා ඛනිජ සඳහා උදාහරණ දෙක බැගින් වෙන වෙනම ලියා දක්වන්න. (ල.04)

II. පෘථිවි පාෂාණ ස්වාභාවිකව නිර්මාණය වී ඇති ආකාරය අනුව වර්ග කර ඇත. ඒවා මොනවාද? (ල.05)

III. ඉන් එක් වර්ගයක් පිළිබඳව කෙටි සටහනක් ලියන්න. (ල.04)

02). සුදුසු පරිදි යා කරන්න.

| | | |
|---|---|---|
| 1. | ශ්‍රී ලංකාවේ බෝගල ප්‍රදේශයේ බහුලව පවතින ඛනිජයකි | ආග්නේය පාෂාණ |
| 2. | භෞතික සාධක හේතුවෙන් පාෂාණය කුඩා කැබලි වලට වෙන්වීම | මිනිරන් |
| 3. | පොළොව තුළදී මැග්මා වලින් සකස්වේ | ග්‍රැනයිට් |
| 4. | කළුගල් විශේෂයකි | හුණුගල් |
| 5. | අවසාධිත පාෂාණයකි | පාෂාණ ජීර්ණය |

(ල.05)

03). පහත දැක්වෙන ප්‍රකාශ හරි (✓) හෝ වැරදි (x) බව ලකුණු කරන්න .

1. ඛනිජ යනු නිශ්චිත ජ්‍යාමිතික හැඩයෙන් යුතු ස්ඵටික වේ . ( )
2. මයිකා යනු විපරීත පාෂාණයකි. ( )
3. ජෛවීය සාධක මගින්ද පාෂාණ ජීර්ණය වේ. ( )
4. ශ්‍රී ලංකාවේ ස්වාභාවික ඛනිජ වර්ග විශාල සංඛ්‍යාවක් ඇත. ( )
5. ආග්නේය පාෂාණ මෘදු බවක් දක්වයි. ( )

(ල.10)

04). ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විවිධ ඛනිජ වර්ග 05 ක් නම් කරන්න. ඒවා හමුවන ප්‍රදේශ ද ලියා දක්වන්න.

(ල.10)

The National e-learning Portal for the General Education